
2022



වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

ගාලු උරුමය පදනම

බුද්ධශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

காலி மரபுரிமை மன்றம்

தேசிய மரபுரிமைகள்இ அருங்கலைகள் மற்றும் கிராமிய சிற்பக்கலைகள் மேம்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சு

Galle Heritage Foundation

Ministry of Buddhashasana, Religious and Cultural Affairs

GALLE HERITAGE FOUNDATION

2022 වාර්ෂික වාර්තාව



ගාලු උරුමය පදනම

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ලිපිනය	:-	අංක 12, රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල.
දුරකථන අංක	:-	091-2246784 / 091-2231982
ඊ මේල්	:-	herifo@sltnet.lk
වෙබ් අඩවිය	:-	www.galleheritage.gov.lk
මුහුණු පොත් පිටුව	:-	https://www.facebook.com/profile.php?id=100087904854333&mibextid=ZbWKwL
වැය ශීර්ෂ අංකය	:-	**401**

පටුන

01 පරිච්ඡේදය

1.1	හැඳින්වීම	1-2
1.2.	දැක්ම මෙහෙවර සහ අරමුණු	2-3
1.3.	ප්‍රධාන කාර්යයන්	3
1.4.	ගාලු උරුමය පදනමේ සංවිධාන සටහන	4
1.5.	ගාලු උරුමය පදනමේ මූලික අංශ	5
1.6.	ගාලු උරුමය පදනමේ ආයතනගත අරමුදල්	5

02 පරිච්ඡේදය

2.1.	2022 වර්ෂය තුල ගාලු උරුමය පදනමේ කාර්යයන්හි ප්‍රගතිය	6-11
2.2.	අභියෝග	12
2.3	ඉදිරි ඉලක්ක	12-13

03 පරිච්ඡේදය

3.6	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	14
3.7.	වෙන් කරන ලද ප්‍රදිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය	14
3.8.	මු.රේ. 208 ප්‍රකාරව, පදනමට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	15
3.9	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	15
3.10	විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ විගණන මතය	16-33

04 පරිච්ඡේදය

4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	34

05 පරිච්ඡේදය

5.1	හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු	34-35
5.2	තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	35

06 පරිච්ඡේදය

6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	36
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය	36
6.3	මානව සම්පත් සංවර්ධනය	37

07 පරිච්ඡේදය

	අනුකූලතා වාර්තාව	38-48

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම



ගාලු උරුමය පදනම 1994 අංක 07 දරණ පාර්ලිමේන්තු පනත මගින් රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවනු ලැබීය. එහි ප්‍රධාන අරමුණු වූයේ ගාලු කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීමයි. මෙතෙක් විවිධ අමාත්‍යාංශ යටතට පත්වූ ගාලු උරුමය පදනම වර්තමානයේ බුද්ධශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ගාලු කොටු පවුර පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස 1971 දී ගැසට් කිරීමත්, 1988 දී යුනෙස්කෝව විසින් ලෝක උරුම ස්ථානයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම හේතුකොට ගෙන රජයේ සහ මහජනයාගේ වැඩි අවධානය එයට යොමුවීමත් සමඟ මෙහි ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා ගාලු උරුමය පදනම විසින් විවිධ පියවර ගනු ලැබිණ.

- **ගාලු උරුමය පදනමෙහි බලසීමාවට අයත් භූමි ප්‍රදේශය**

යුනෙස්කෝ ආයතනය මගින් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ගාලු කොටුව ගාලු උරුමය පදනමේ වපසරියට අයත් වේ. මුර අට්ටාල 14 කින් සමන්විත මෙම කොටුවේ කොටු බැම්මේ දිග ප්‍රමාණය ආසන්න වශයෙන් කි.මී.2.5ක් පමණය

❖ **ගාලු කොටුවේ භෞතික පරිසරය**

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශය තුළ පිහිටි 96 ඩී ග්‍රාමසේවා වසම ගාලු කොටුව අයත් ප්‍රදේශය වේ. ප්‍රමාණයෙන් අක්කර 80.9067 (හෙක්ටෙයාර් 32.7418) ක භූමි භාගයකින් ගාලු කොටුව සමන්විත වේ.

❖ **ගාලු උරුමය පදනම් කළමනාකරණ මණ්ඩලය**



ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය, කලමනාකරණය සහ පාලනය කළමනාකරණ මණ්ඩලය විසින් සිදු කරනු ලබයි.ගාලු (පනතේ 05වන වගන්තිය පරිදි)

ඒ අනුව කලමනාකරණ මණ්ඩලය සඳහා නිලබලයෙන් පත්වන සාමාජිකයන් 14 දෙනෙක් ද අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් 06 දෙනෙක් (පත්කල සාමාජිකයන්) සහ නිල බලයෙන් පත් වූ සාමාජිකයන් විසින් අවුරුදු දෙකකට වරක් තෝරා පත් කර ගන්නා ලද (තෝරා පත්කළ සාමාජිකයන්) 06 දෙනෙක් ඇතුළුව සියලුම සාමාජිකයන් 26 දෙනෙකුගෙන් සමන්විත වේ. මණ්ඩලයේ සාමාජිකයින් විසින් ඔවුන් අතරින් දෙදෙනෙකු පිළිවෙළින් සභාපතිවරයා ලෙසද උප සභාපතිවරයා ලෙස ද තෝරා පත් කර ගනු ලැබේ.

1.2. දැක්ම මෙහෙවර සහ අරමුණු

1.2.1. දැක්ම

ගාල්ල කොටුව දකුණු ආසියාවේ ප්‍රශස්ථම බලකොටු නගරයකි.

1.2.2. මෙහෙවර

සංස්කෘතික ලෝක උරුමයක් වශයෙන් එහි කැපී පෙනෙන විශ්වීය වටිනාකම ආරක්ෂා කර ගනිමින් ප්‍රජා සහභාගීත්ව උරුම කළමනාකරණ ක්‍රමවේදයක් තුළින් වඩාත් ආකර්ෂණීය සංස්කෘතික උරුම සංචාරක ගමනාන්තයක් ලෙස ගාලු කොටුව හා එහි හාත්පස භූමියේ තිරසාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම.

1.2.3. අරමුණු


i. සුවිශේෂී විශ්වීය වටිනාකමකින් යුතු ලෝක උරුමයක් ලෙස ගාලු කොටුවේ සංවර්ධනයට දායක වීම.
ii. ගාලු කොටුවේ සුවිශේෂී පුරාවිද්‍යාත්මක වටිනාකම ආරක්ෂා කරන අතරම, ආකර්ෂණීය සංචාරක පුරවරයක් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.
iii. ප්‍රජා මතයන්ට ගරු කරමින් තීන්දු තීරණ ගැනීමේදී ප්‍රජා සහභාගීත්වය ද ලබාගනිමින් ලෝක උරුමයක් ලෙස ගාලු කොටුව පවත්වාගෙන යාම.
iv. ජනතාවගේ ජීවනෝපාය නගාසිටුවීමට සෘජුව හා වක්‍රව දායක වීම.

1.3. ප්‍රධාන කාර්යන්


i. ගාලු කොටුව හා ඒ ආශ්‍රිත පශ්චාත් භූමියේ ඓතිහාසික වශයෙන් වැදගත් ගොඩනැගිලි සංරක්ෂණය හා සුදුසු පසුභාවිතය
ii. ඓතිහාසිකත්වය ආරක්ෂා කිරීම පිළිබඳ දැනුම්වත් කිරීම ගාලු කොටුව ප්‍රවර්ධනය කිරීම.
iii. ගාලු කොටුව තුළ සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම.
iv. සංචාරක ආකර්ශනීය ස්ථාන ඇති කිරීම හා සංවර්ධනය කිරීම.
v. ගාලු කොටුව නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම.
vi. පාරම්පරික ජීවනෝපායන් නංවාලීම.
vii. ගාලු කොටුව ආශ්‍රිත මානව ක්‍රියාකාරකම් විධිමත් කිරීම හා නියාමනය.

1.4. ගාලු උරුමය පදනමේ සංවිධාන සටහන

අනුමත කාර්යය මණ්ඩලය ඇතුළත් සංවිධාන සටහන



1.5. ගාලු උරුමය පදනමේ මූලික අංශ



1.6. ගාලු උරුමය පදනමේ ආයතනනගත අරමුදල්

- ඉතුරුම් තැන්පතු - 4,779,766.00
- ස්ථාවර තැන්පතු - 36, 438,075.00

02 පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. 2022 වර්ෂය තුල ගාලු උරුමය පදනමේ කාර්යයන්හි ප්‍රගතිය

ගාලු උරුමය පදනම පිහිට වූ දා සිට මේ දක්වා ගාලු උරුමය පදනමේ සේවාවන් සළකා බැලීමේදි මෑත කාලය තුල කැපී පෙනෙන වෙනසක් සහිත සේවාවන් රැසක් ගාල්ල කොටුව වාසී ජනතාවට ලබා දීමට ගාලු උරුමය පදනමට හැකි වී ඇත.

2.1.1 පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල සංරක්ෂණය කර වාණිජ භාවිතාව සඳහා යෙදවීම

- **අරමුදල් ප්‍රභවය -** ශ්‍රී ලංකා රජය / ගාලු උරුමය පදනම
- **අන්තර්ගත වියදම -** රු මිලියන 33
- **ව්‍යාපෘති කාලසීමාව -** 2022-2023

බ්‍රිතාන්‍ය පාලන අවධියේ කම්කරු සුපරීක්ෂකයින්ගේ නේවාසිකාගාරයක් ලෙස භාවිතා කර ඇති මෙම ගොඩනැගිල්ල අවධි කිහිපයක ඉතිහාසයක් හදුනා ගත හැක. ඇතැම් බිත්ති කොටස්වල කොරල් භාවිතයෙන් ඉදිකර ඇති අතර ඇතැම් බිත්ති කොටස් කටුමැටි බිත්ති ලෙසද ඇතැම් කොටස් ගඩොල් බිත්ති ලෙසද ඉදි කර ඇත. 2018 වර්ෂය දක්වාම මෙම ගොඩනැගිල්ල පොලිස් නිළ නිවාස ගොඩනැගිල්ලක් ලෙස භාවිතා විය. 2018 වර්ෂයේදී මෙම ගොඩනැගිල්ල වානිජ කටයුතු සඳහා යෙදවීම පිණිස ගාලු උරුමය පදනම වෙත ලැබිණ.

ගාල්ල කොටුව පල්ලිය වීදියේ පිහිටා පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල සංරක්ෂණය කර විවිධ වානිජ කටයුතු සඳහා (තේ සහ කෝපි අලෙවි සැල, මැණික් සහ ස්වර්ණාභරණ සාප්පුව, අත් යන්ත්‍ර රෙදිපිළි සහ ඒ ආශ්‍රිත නිමවුම්, සමරු තිළිණ අලෙවි සැල, රූකඩ වෙස්මුහුණු සහ දුම්බර රටා පැදුරු ආදී නිමවුම් අලෙවි සැල හා ආපනශාලා 02 කින් යුක්තව අලෙවි සැල් ලෙස) භාවිතා කිරීමට ප්‍රශස්ථ මට්ටමේ ව්‍යාපාරික ප්‍රජාව වෙත බදු පදනමට ලබා දීමෙන් ආදායම් උපයා ගැනීමට ගාලු උරුමය පදනම අපේක්ෂා කෙරේ.

ගොඩනැගිල්ලේ සැලසුම් සකස් කර දීමෙන් වරලත් වාස්තු විද්‍යාඥ මංජුල කල්හාර මහතා ද ඉංජිනේරු උපදේශක ආයතනය ලෙස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයත් කොන්ත්‍රාත්කාර සමාගම ලෙස ලියනාරච්චි බිල්ඩර්ස් ආයතනයත් සම්බන්ධ විය.

මේ වන විට ගොඩනැගිල්ලේ මූලික සංරක්ෂණ කටයුතු අවසන් වී ඇති අතර බාහිර වැඩ කටයුතු සිදු කරමින් පවතී. තනි මහල් ගොඩනැගිල්ලක් ලෙස ඉදිකර ඇති මෙම ගොඩනැගිල්ල සම්පූර්ණ වර්ග අඩි 3,380 ක වපසරියකින් යුක්ත අතර රථගාල් දෙකකින් ද සමන්විත වේ.



2.1.2. සඳු යුධ අට්ටාලය සිතුවම් සහිත කෞතුකාගාරයක් ලෙස සංවර්ධනය කිරීම

ගාල්ල කොටුවේ පිහිටි සඳු යුධ අට්ටාලයේ ඉදිකර තිබූ යුධ කාමරයක් ගාල්ල කොටුව හා බැඳුනු ඓතිහාසික සිදුවීම් පිළිබඳව දැනුම්වත් කරන සිතුවම් සහිත කෞතුකාගාරයක් ලෙස සංවර්ධනය කර මහජනතාවට විවෘත කරනු ලැබීය.









2.1.3. ලෝක බැංකු ආධාර ව්‍යාපෘතිය යටතේ කොටු බැම්ම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියට සහාය ලබා දීම.

ලෝක බැංකු ආධාර ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පවරන ලද කළු කොටුව සහ තරු යුධ අට්ටාල දෙක අවබෝධතා ගිවිසුමක් මගින් ගාලු උරුමය පදනම වෙත පවරාගෙන යුධ ගැලරි ලෙස මහජනතා ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීම, 2022 වසරේදී ඉහත කාර්යයන්වලට අමතරව සිදුකරන ලදි. මේ වන විට මෙම ගැලරි දෙක වෙත දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ශනය දිනා ගැනීමට සමත් වී ඇත. මෙමගින් ඉතා වටිනා පෞරාණික තොරතුරු , දැනුම ලබා ගැනීමට අවස්ථාව හිමි වේ.

❖ **තාරකා ප්‍රදර්ශන ගැලරිය**

පැරණි යුධ බෙහෙත් ගබඩාවක් ගැලරියක් බවට පරිවර්තනය කර ඇත. මෙම ප්‍රදර්ශන ගැලරිය තුල ලන්දේසි යුධ අවධියේ වෙඩි බෙහෙත් සකස් කරන ආකාරය, අඹරපු ආකාරය, සකස් කරන ලද වෙඩි බෙහෙත් ගබඩා කර තබා ඇති ආකාරය ප්‍රදර්ශනය කෙරෙන ප්‍රදර්ශන භාණ්ඩ සහ ආකෘති මඟින් ප්‍රදර්ශනය කිරීම සිදු කරයි.




❖ **කළු කොටුව ප්‍රදර්ශන ගැලරිය**

කළු කොටුවේ ඇති වෙඩි බෙහෙත් ගබඩාව ප්‍රදර්ශන ගැලරියක් බවට පත් කර ඇත. මෙහිදි පෘතුග්‍රිසි යුධ අවධියේ වෙඩි බෙහෙත් ගබඩාවක සිදු විම් සහිත ප්‍රතිමා හා ප්‍රදර්ශන භාණ්ඩ මෙහි තැන්පත් කර ඇත.






2.1.4. ගාලු කොටුව පරිශ්‍රය අවට තණකොළ කපා නඩත්තු කර පවත්වා ගෙන යාම

ගාලු උරුමය පදනම විසින් 2022 වර්ෂයේ පළමු කාර්තුව තුලදී ගාලු කොටුව පරිශ්‍රය සම්පූර්ණ වශයෙන් දෛනික කම්කරුවන් යොදා තණකොළ කපා නඩත්තු කටයුතු සිදු කරමින් කොටුව අලංකාරව පවත්වාගෙන යාමට මනා කැපවීමෙන් කටයුතු කරන ලදී. මෙහිදි රටේ පැවති ආර්ථික අර්බුධකාරී තත්වය හමුවේ අවශ්‍ය ඉන්ධන සපයා ගැනිමේදි ඉතා ගැටලුකාරි තත්වයන් වලටද මුහුණ දෙමින් මෙම කර්තව්‍යය සාර්ථක
කර ගැනිමට විශාල පරිශ්‍රමයක් දරන ලදී.





2.1.5. ගාලු කොටුව පරිශ්‍රය පිරිසිදුව පවත්වාගෙන යාම වෙනුවෙන් ශ්‍රමදාන වැඩසටහන් සිදු කිරීම

ලෝක උරුම ගාලු කොටුව නැරඹීම සඳහා දෛනිකව විශාල ප්‍රමාණයක් දෙස් විදෙස් සංචාරකයින්ගේ පැමිණීම සිදු වේ. සංචාරක නැරඹුන් ස්ථානයක් වූ ලෝක උරුම ගාලු කොටුව සංචාරකයින්ගේ කැලිකසළ බැහැර කිරීම නිසි පරිදි සිදු නොවීම නිසා දෛනික විශාල ලෙස කොටුව පරිශ්‍රය අවට විවිධ කුණු කසල දමා යාම දක්නට ලැබේ. කොටුව කලමනාකරණය කර සංරක්ෂණය කර පවත්වාගෙන යාමට කටයුතු කරන ප්‍රධාන ආයතනය ලෙස ගාලු උරුමය පදනම විසින් 2022 වර්ෂයේ සිට සෑම මසකම සතියකට දෙපාරක් විවිධ ස්වේච්ඡා සංවිධාන, විවිධ ආයතන, පාසල් සහ රජයේ ආයතනද සම්බන්ධ වෙමින් ශ්‍රමදාන පැවැත්වීම සිදු කරනු ලබයි. එම නිසා මේ වන විට සංචාරකයින්ගේ ද කුණු කසල ක්‍රමවත්ව බැහැර කිරීම් වැඩිදියුණු වෙමින් පවතින බවක් දක්නට ලැබේ. අප විසින් සිදු කරනු ලබන ශ්‍රමදාන හේතුවෙන් ගාලු කොටු පවුර පවිත්‍රව අලංකාරව සංචාරක ගමනාන්තයක් ලෙස විවෘත කිරීමට හැකියාව ලැබී ඇත.






2.1.6. ගාලු උරුමය පදනම තොරතුරු මධ්‍යස්ථානය මගින් නව දැනුම හඹායන්නන් සඳහා තොරතුරු ලබාදීම සඳහා පුස්ථකාල පහසුකම් ලබා දීම සහ උරුමය පිළිබඳ අර්ථකතන සේවාව සැපයීම.

ගාලු උරුමය පදනමේ තොරතුරු මධ්‍යස්ථානය වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා විදේශිකයින් 450කට අධික සංඛ්‍යාවක් තොරතුරු මධ්‍යස්ථානයට වාර්තා කර ඇත. එම රටවල් අතරප්‍රංශය,රුසියාව,ස්විස්ටර්ලන්තය,කොරියාව,නවසීලන්තය,නෙදර්ලන්තය,ස්පාඤ්ඤය,සිම්බාබ්වේ, පෘතුගාලය,එංගලන්තය,ඉරාකය,ඉන්දියාව සහ UK ප්‍රමුඛ වේ.

- ❖ විශ්ව විද්‍යාල සිසුන් 22කට වඩා වැඩි ප්‍රමාණයකට ගාලු කොටුව පිළිබඳ උපාධි නිබන්ධන සඳහා තොරතුරු ලබා දීම.
- ❖ පාසල් සහ වෙනත් කණ්ඩායම් 20කට වැඩි ප්‍රමාණයටකට කොටුව පිළිබඳ දැනුවත් කිරීම් සිදු කිරිම.
- ❖ තොරතුරු මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන පොත් අලෙවිය මගින් රුපියල් ලක්ෂයකට අධික අලෙවියක් සිදුකර ඇති අතර රු:20,000.00 වැඩි ලාභයක් ඒ සඳහා උපයා ඇත. එමෙන්ම තොරතුරු මධ්‍යස්ථානයේ සිදු වන අනෙකුත් පහසුකම්ද කිසිදු අඩුවක් නොමැතිව සංචාරක ආකර්ශනීය ස්ථානයක් ලෙස පවත්වා ගැනිමට උපරිම කැපවීමෙන් කටයුතු කරන අතර තොරතුරු ලබා දීමද සිදු වේ.
- ❖ ගාලු උරුමය පදනම නිලධාරින්ගේ ආකල්ප සංවර්ධන වැඩසටහනක් 2022.01.07 වන දින කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයේ පැවැත්වීම.
- ❖ ගාලු උරුමය පදනම නිලධාරින්ට ඵලදායි වැඩසටහනක් 2022 .02.15 වන දින කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයේ පැවැත්වීම.

2.1.7. ගාලු උරුමය පදනමේ ආදායම් උත්පාදනමාර්ග

I. ප්‍රදර්ශන ගැලරි නැරඹීමට දේශිය විදේශීය සංචාරකයින් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කිරිම තුලින් ආදායම් ලබා ගැනීම.

II. සිප්නාරා ගොඩනැගිල්ලෙහි කොටසක් ආපනශාලා ලෙස පවත්වාගෙන යාමට බදු පදනම මත ලබා දීම.

III. ට්‍රයිටන් ගොඩනැගිල්ල විවිධ අත්කම් නිර්මාණ අලෙවිය සඳහා බදු පදනම මත ලබා දීම.

IV. පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල ව්‍යාපාරික ස්ථාන ලෙස ලබා දීමට සංරක්ෂණය කොට සංවර්ධනය කිරීම.

2.1.8. 2022 වර්ෂය තුළ ගාලු උරුමය පදනමේ කාර්යසාධනය පිළිබඳව සංක්ෂිප්ත වාර්තාව

i. 2022 වර්ෂය සඳහා ගාලු උරුමය පදනමේ ගිණුම් ප්‍රකාශන සඳහා තත්වාගණනය නොකළ විගණන මතයක් (unqualified Opinion) ලබා ගැනීමට සමත් වී ඇත.

ii. පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම.

iii. සඳු යුධ අට්ටාලය සිතුවම් සහිත කෞතුකාගාරයක් ලෙස සංවර්ධනය කොට ආරම්භ කිරීම.

iv. ලෝක බැංකු ආධාර ව්‍යාපෘතිය යටතේ කොටු බැම්ම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියට සහාය ලබා දීම

v. තාරකා යුධ ගැලරිය සහ කළු කොටුව යුධ ගැලරිය ප්‍රදර්ශන ගැලරි ලෙස මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීම.

vi. ගාලු කොටුව පරිශ්‍රය අවට තණකොළ කපා නඩත්තු කර පවත්වා ගෙන යාම

vii. ගාලු කොටුව පරිශ්‍රය පිරිසිදුව පවත්වාගෙන යාම වෙනුවෙන් ශ්‍රමදාන වැඩසටහන් සිදු කිරීම.

viii. ගාලු උරුමය පදනම නිලධාරින්ගේ ආකල්ප සංවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම.

ix. ගාලු උරුමය පදනම නිලධාරින්ට ඵලදායිතාවය වර්ධනය සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.

2.2. අභියෝග

අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමුවිය යුතු ආයතනයට වැදගත් වෙනත් කරුණු

- ගාලු උරුමය පදනම පනත සංශෝධනය කිරීම.

2.3. ඉදිරි ඉලක්ක

කාර්ය සාධනය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

<u>මධ්‍ය කාලීන</u>

I. ගාලු උරුමය පදනම සතු ප්‍රාග්ධන සම්පත් තරකර ගනිමින් මූල්‍ය හැකියාව වර්ධනය කිරීම පිණිස ගාල්ල කොටුව පල්ලිය විදියේ පිහිටි පැරණි ගොඩනැගිල්ලක් සංරක්ෂණය කරනු ලැබූ අතර 2023 වර්ෂයේ සිට එමඟින් ආදායම් උත්පාදනය කිරීමට අපේක්ෂිතය.

II. ගාල්ල කොටුව හා එහි ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු සමාජගත කිරීම උදෙසා සඳු යුධ අට්ටාලයේ ගාලු කොටුව ඓතිහාසික පසුබිම පිළිඹිබු කරන ප්‍රදර්ශන ගැලරියක් මහජනතාව වෙනුවෙන් විවෘත කිරීම .

කෙටි කාලීන

I. ගාලු උරුමය පදනම සඳහා ව්‍යාපාරික සැලැස්මක් (Business Plan) සකස් කොට වෙනත් කටයුතු සඳහා මධ්‍යම රජයෙන් දැරීමට සිදුවන වැයබර අවම කිරීමට කටයුතු කිරීම.

II. ගාලු උරුමය පදනම නිලධාරින්ට ඵලදායීතාවය වර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම.

III. ගාලු උරුමය පදනම නිලධාරින්ගේ ආකල්ප සංවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම.

.....

අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි
ගාලු උරුමය පදනම

03 පරිච්ඡේදය

වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.01.99	අනෙකුත් කුලි ආදායම් ලැබීම්	2400	2440	2443	100%
2003.99.00	අනෙකුත් ලැබීම්	600	800	865	108%
2002.02.99	වෙනත් පොලී ආදායම් ලැබීම්	3000	3900	3974	101%

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	12,000	-	11,514	95.95%
ප්‍රාග්ධන	18,000	-	18,000	100%

- 2022 වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් අක්මුදල් ලබාදුන් ප්‍රමාණය රු.11,514,093ක් පමණි. එබැවින් තත්ව වියදම ඊට සමාන විය.

3.8 මු .රේ. 208 ප්‍රකාරව, පදනමට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කර ගනනා ලද ප්‍රතිපාදන,ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
අදාල නොවේ						

3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු,000

අනු අංකය	කේත විස්තරය	**31.12.2022** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2022** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	අදාල නැත	3,443		
9152	යන්ත්‍රෝපකරණ		31		
9153	ඉඩම්		1,246,500		
9154	අස්පෘශ්‍ය වත්කම		425		
9155	ජීව විද්‍යාත්මක වත්කම්		-		
9160	කෙරීගෙන යන වැඩ		-		
9180	ආයෝජන වත්කම		1,396		
	යටිතල පහසුකම් සපයන වත්කම්	අදාල නැත	18,498		
	ප්‍රවේණිගත වත්කම්		6,100		
	ගෘහ භාණ්ඩ හා සවි කිරීම්		4,711		
	කාර්යාලීය උපකරණ		508		
	වෙනත් වත්කම්		7,864		
	විලම්භීත වත්කම්		13,466		

3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ විගණන මතය

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන හොඳම විගණන මතය 2022 වර්ෂය සඳහා ලබා ගැනීමට ගාලු උරුමය පදනම සමත් වී ඇත. එම විගණන මතය පහත පරිදි උපුටා දක්වා ඇත.

"ගාලු උරුමය පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ."

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } SPCG/GL/C/GHF/FA/2022 මෙම අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 මැයි 19 දින

ගාලු උරුමය පදනම්
706
★ 26 MAY 2023 ★

සභාපති,
ගාලු උරුමය පදනම.

ගාලු උරුමය පදනමේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

පිටපත: 1. ලේකම්, බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SPCG/GL/C/GHF/FA/2022 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023 මැයි 19 දින

සභාපති,
ගාලු උරුමය පදනම.

ගාලු උරුමය පදනමේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ගාලු උරුමය පදනමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ගාලු උරුමය පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. +94 11 2 88 70 28 - 34 | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. +94 11 2 88 72 23 | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka. ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගාලු උරුමය පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ගාලු උරුමය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ගාලු උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ගාලු උරුමය පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ගාලු උරුමය පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුනද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ගාලු උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන යාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ගාලු උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගාලු උරුමය පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ගාලු උරුමය පදනම් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ගාලු උරුමය පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ගාලු උරුමය පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ගාලු උරුමය පදනමට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති,රීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
මුදල් රෙගුලාසි 880 හා 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 07 දරන චක්‍රලේඛයෙහි 06 ඡේදය	මුදල් හෝ නොග සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා බලය ලබාදී ඇති සියලුම නිලධාරීන් විසින් ඇප තැබිය යුතු වුවද ගාලු උරුමය පදනමේ ගණකාධිකාරී ඇතුලු ප්‍රදර්ශන කුටි වල සහ තොරතුරු මධ්‍යස්ථානයේ සිටින නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි.

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) ගාලු උරුමය පදනමට අයත් ඉකිරිකිරීමේ ගිණුම් 03 ක මාසික සාමාන්‍ය ශේෂය රු.7,410,238 ක් වූ අතර, එම අතිරික්ත මුදල් සුරක්ෂිතව ආයෝජනය කර ඉහළ පොළී ආදායමක් ඉපයීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

(ආ) බ්‍රිතාන්‍ය පාලන අවධියේ කම්කරු සුපරීක්ෂකයින්ගේ නේවාසිකාගාරයක් ලෙස භාවිතා කර තිබුණු ගොඩනැගිල්ලක් 2018 වර්ෂය දක්වාම පොලිස් නිලනිවාසයක් වශයෙන් භාවිතා කර තිබුණු අතර වාණිජ කටයුතු සඳහා යෙදවීමේ අරමුණින් ගාලු උරුමය පදනම වෙත භාරදී තිබුණ ද 2023 මාර්තු 23 විගණිත දිනය වන විටත් එම අරමුණ ඉටු කරගෙන නොතිබුණි.

(ඇ) ගාලු උරුමය පදනමට, වැඩි බලතල ලබා ගැනීමට හා ආදායම් උත්පාදන අවස්ථා නංවාලීම අරමුණු කොට ගෙන සඳහා 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනත සංශෝධනය කිරීමේ පවශ්‍යතාවය හඳුනාගෙන තිබුණි. ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර වසර 10 ක් ගතවී තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පනත සංශෝධනය කර නොතිබුණි.

(ඈ) ප්‍රවේශ පත්‍ර අලෙවි කර ආදායම් උපයන තුලින් සංචාරක නැරඹුම් ස්ථානයක් වන 'කලු කොටුව' ගාල්ල නියෝජ්‍ය පොලිස්පති කාර්යාල පරිශ්‍රය තුල පිහිටා ඇති බැවින් නැරඹුම් ස්ථානයට ප්‍රවේශ වන මාර්ගය නිරන්තරයෙන් ගේට්ටුවකින් වසා තිබෙන බව නිරීක්ෂණය විය. ඒ අනුව මෙම සංචාරක ස්ථානය තුලින් ගාලු උරුමය පදනමට ප්‍රමාණවත් ආදායමක් උත්පාදනය නොවන බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගාලු උරුමය පදනමේ තෘතියික මට්ටමේ තනතුරු 02 ක පුරප්පාඩු පවතින අතර කඩවත් සතර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් වැටුප් ලබන සේවකයන් 06 දෙනෙකුද, බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් වැටුප් ලබන සේවකයන් 02 කුද, අක්මීමන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් වැටුප් ලබන සේවකයන් 02 කුද අතිරික්ත සේවයේ යොදවා තිබුණි.

(ඊ) ගාලු උරුමය පදනමට අයත් කළමනාකරණ මණ්ඩලය සඳහා තෝරා පත්කර ගෙන ඇති සාමාජිකයින් භය දෙනාගෙන් හතර දෙනෙකුගේ ධුර කාලය 2021 ජූලි 27 දින අවසන් වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නව සාමාජිකයින් තෝරා පත් කර ගෙන නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු සංශෝධිත අයවැය පුරෝකථනයන් හා සත්‍ය වියදම සමඟ සැසඳීමේදී සියයට 33 ක සිට සියයට 1059 දක්වා විචලතාවයන් නිරීක්ෂණය විය.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු. 42,270 ක් විය යුතු වුවද රු. 593 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ වියදම රු. 41,677 ක් අඩුවෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබුණු අතර, ගෙවිය යුතු පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු.1,434,380 ක් විය යුතු වුවද රු. 1,356,540 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන බැරකම් රු. 77,840 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) නිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

නිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "නගාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුය. සමාලෝචිත වර්ෂයට අදාළව ගාල්ල උරුමය පදනම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණද, එක් නිරසර සංවර්ධන ඉලක්කයක් හැර ගාල්ල කොටුව ආරක්ෂා කර ගනිමින් දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණය තුලින් තවදුරටත් අවධානය යොමු කළ හැකි නිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

විගණන නිරීක්ෂණ ක්ෂේත්‍රය	විගණන නිරීක්ෂණය	විගණන නිර්දේශය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්ගේ යෝජනා
1.4.2 ගිණුම්කරණ අඩුපාඩු	(අ) (අ)සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු.42,270 ක් විය යුතු වුවද රු.593 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ වියදම රු.41,677 ක් අඩුවෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබුණු අතර, ගෙවිය යුතු පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු.1,434,380ක් විය යුතු වුවද රු.1,356,540 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන බැරකම් රු.77,840 ක් අඩුවෙන් දක්වා තිබුණි.	නිවැරදිව ගණනය කිරීම්කර ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.	ජර්නල් සටහන් මඟින් පෙන්වා දෙන ලද වරද නිවැරදි කිරීමට කටයුතු කරමි.	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම හා එකඟ විය. 2023 මැයි මාසයේ ගිණුම් වලට අදාල ජ'නල් සටහන් යෙදීමට කළමනාකාරිත්වය සටහන් කරගන්නා ලදී.
	(ආ) 2022 දෙසැම්බර් 27 දින ආරම්භ කරන ලද ලංකා බැංකු ගිණුම් අංක 90061918 දරන රු.3,550,000 ක් වූ ස්ථාවර තැන්පතුව සඳහා සමාලෝචිත වර්ෂයේ දින 04 ක් වෙනුවෙන් ලැබිය යුතු පොලී ආදායම රු.10,115 ක් වූවත් එය රු.27,816 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් හා පොලී ආදායම රු.17,701 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. (ඇ) 2022 දෙසැම්බර් 20 දින ආරම්භ කරන ලද ලංකා බැංකු ගිණුම් අංක 900034918 දරන රු.4,250,000 ක් වූ ස්ථාවර තැන්පතුව සඳහා සමාලෝචිත වර්ෂයේ දින 11 ක් වෙනුවෙන්	නිවැරදිව ගණනය කිරීම්කර ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.	90061918 සහ 90034918 දරන ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ආදායම නිවැරදිව ගණනය කර තිබුණද, ජර්නල් වවුචර් සඳහා එය පිටපත් කිරීමේ දී යම් අතපසුවීමක් සිදු වී ඇත. 2023/03/20 සහ 2023/03/27 දින මෙම ස්ථාවර තැන්පතු පරිණත වූ අතර එය 2023 මාර්තු මස ජර්නල් වවුචර් යෙදීමේදී ගිණුම්කරණ සටහන් මඟින්	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම හා එකඟ විය. 2023 අප්‍රේල් මාසයේ ගිණුම් වලට අදාල ජ'නල් සටහන් යෙදීමට කටයුතු කළ බව කළමනාකාරිත්වය විසින් සඳහන් කරන ලදී.

විගණන නිරීක්ෂණ ක්ෂේත්‍රය	විගණන නිරීක්ෂණය	විගණන නිර්දේශය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්ගේ යෝජනා
	ලැබිය යුතු පොලී ආදායම රු.33,301 ක් වූවත් එය රු.12,110 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම වත්කම් හා පොලී ආදායම රු.21,191 ක් බැගින් අඩුවෙන් පෙන්වා තිබුණි.		නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇති බව සඳහන් කරමි.	
1.5 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම	මුදල් හෝ තොග සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා බලය ලබාදී ඇති සියලුම නිලධාරීන් විසින් ඇප තැබිය යුතු වුවද ගාලු උරුමය පදනමේ ගණකාධිකාරී, ප්‍රදර්ශන කුටි වල සහ තොරතුරු මධ්‍යස්ථානයේ සිටින නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි.	යොමුගත නීතිරීති ප්‍රකාරව අදාළ නිලධාරීන්ගෙන් ඇප තැන්පතු මුදල් රඳවා ගැනීමට කටයුතු කළ යුතුය.	මුදල් රෙගුලාසි 880, 881 හා 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 7 දරන චක්‍රලේඛයෙහි 06ඡේදය ප්‍රකාරව හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත යටතේ මුදල් හෝ තොග සම්බන්ධයෙන් ක්‍රියාකරන ඉහත නිලධාරීන්ගෙන් ඇප තැන්පතු මුදල් රඳවා ගැනීමට ක්‍රියා කරන බව කාරුණිකව දන්වා සිටිමි.	කළමනාකාරිත්වය අදහස් දැක්වීම හා එකඟ විය. හැකි ඉක්මණින් ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප මුදල් අය කිරීමට උපදෙස් දෙන ලදී.
